## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2018

-----------------------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය වූ රු. 2,005,156 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | 2017 හා 2018 වර්ෂ වල ගිණුම් සකස් කිරීමේ දී 2018 දෙසැම්බර් 31 දිනට බැංකු මඟින් සනාථ කර තිබූ ශේෂ සහතික අනුව පොලිය ගිණුම් ගත කරන ලදි. කල්පිරි නොමැති ස්ථාවර තැන්පතු වෙනුවෙන් පොලිය ගැලපීමක් සිදු කර නොතිබූ බැවින් ඉදිරි වර්ෂ වල දී මේ කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කර සාමාන්‍ය පොලී අනුපාතිකයට අනුව පොලිය ගණනය කිරීමක් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය උපචිත පදනම මත ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත | වැව්වල පස් ඉවත් කර විකිණීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යයක් නොවූවත් වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට විකිණීම් සිදු කර තිබුණි. | වැව් සංවර්ධන ව්‍යාපෘතිය කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය මත විශේෂ ව්‍යාපෘතියක් ලෙස සිදු කර ඇත. | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ අධිකාරී බලය ලබා දී ඇති කාර්යයන් පමණක් සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ 5 වන වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 11 ක් විය යුතු වුවද අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් සහ වාරිමාර්ග, විදුලිබල හා මහ මාර්ග කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් පත් කර නොතිබුණි. | 2018 වර්ෂයේදී රාජ්‍ය ආයතනවලින් නම් කළ යුතුව තිබූ සම්පූර්ණ සාමාජිකයින් සංඛ්‍යාව පත්කිරීමේ අඩුවක් පැවතියද එම කාර්යය සඳහාද රාජ්‍ය ආයතන නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කර දෙන මෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | පනතේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කළ යුතුය. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 371 (2) (ආ) | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන රු. 500,000 ක් අධ්‍යක්ෂකවරයෙකු වෙත බඩඉරිඟු මිලදී ගැනීමට ලබා දී තිබුණි. එසේ ලබාගත් අත්තිකාරම් මුදල නියමිත කාර්යයට නොයෙදවා දින 22 කට පසුව නැවත පියවා තිබුණි. | බඩ ඉරිගු මිලදී ගැනීමේදී චෙක්පත් මගින් ගොවීන්ට මුදල් ගෙවීමට දින කීපයක කාලයක් වැය වන බැවින් හා අදාල මුදල් බැංකු ගත කිරීම සඳහා බොහෝ ගොවීන්ට බැංකු ගිණුම් නොමැතිවීමත්, යන ප්‍රායෝගික ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල අතර ඒ සඳහා ක්ෂේත්‍රයේදී ගොවීන්ට මුදල් ලබා දීම සඳහා අධ්‍යක්ෂතුමා වෙත රු. 500,000 ක අත්තිකාරම් මුදලක් ලබා දිමට මාණ්ඩලික පත්‍රිකා අංක: 2561/387/2018 මගින් අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව ලබාගත් අත්තිකාරම් මුදල බඩ ඉරිගු මිලදී නොගැනීම හේතුවෙන් නැවත තැන්පත් කරන ලදී. | විශේෂ අවස්ථාවලදී නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේදී ඒ සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 193 කදී ලබා දුන් රු. 3,066,015 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම දින 10 සිට දින 137 ක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. එසේම රජයේ මුදල් අත | සියළුම අත්තිකාරම් 2018 දෙසැම්බර් 31 දිනට පියවීමට කටයුතු කර ඇත. 2019 වර්ෂයේදී අත්තිකාරම් පියවීමෙන් පසු පමණක් අත්තිකාරම් ලබා දීමට කටයුතු කර ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම කළ වහාම පියවිය යුතු අතර එක් අත්තිකාරමක් පියවීමට ප්‍රථම තවත් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රඳවාගෙන ප්‍රමාද වී පියවීම් සිදු කරනු ලබන නිලධාරීන්ට දිගින් දිගටම තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. එසේ එක් තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට පෙර රු. 2,488,800 ක් වූ තවත් තත්කාර්ය අතුරු අග්‍රිම නිලධාරීන් 12 කට අවස්ථා 174 කදී සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | අවස්ථා 19 කදී නිලධාරීන් 07 දෙනෙකු තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස රු. 770,000 ක් ලබාගෙන කාර්යය ඉටු නොකර දින 10 සිට දින 349 ක් දක්වා කාලයක් මුදල් අත රඳවාගෙන නැවත පියවා තිබුණි. | ඇතැම් කාර්යයන් සිදුකිරීම් සඳහා ලබාගත් අත්තිකාරම් එම කාර්යය කල්දැමීම හෝ සිදු නොකිරීම මත නැවත පියවා ඇත. | අවශ්‍යතාවය පරීක්ෂා කර අත්තිකාරම් ගෙවිය යුතු අතර ලබාගත් අත්තිකාරම භාවිතා නොකරන්නේ නම් වහාම පියවීමට නියෝග කළ යුතුය. |
| (ඉ) | 2017 නොවැම්බර් 07 දිනැති අංක දරණ 22/99 (xxxiii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නියෝජ්‍ය / සහකාර මට්ටමේ තනතුරු දරන රාජ්‍ය නිලධරයන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් පමණක් සැපයිය හැකි වුවද මණ්ඩලය විසින් සහකාර අධ්‍යක්ෂ (පාලන) හා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) නිලධාරීන්ට පුද්ගලික ප්‍රවාහන පහසුකම් සපයා තිබුණු අතර ඒ සඳහා පිළිවෙලින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 72,254 ක් සහ රු. 70,207 ක් ගෙවා තිබුණි. | අදාළ මුදල් මාස 06 ක කාලයක් තුළදී අය කර ගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල මාණ්ඩලික පත්‍රිකා අංක 2643/391/2018 අනුව උපදෙස් ලබා දී ඇත. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයේ නිර්දේශයන්ට අනුව අය කර ගැනීමට කටයුතු කරමි. | ප්‍රවාහන පහසුකම් වෙනුවට ගෙවා තිබුණු මුදල් අයකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 41,940,044 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 37,472,381 ක අතිරික්තයක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,467,663 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු. 8,827,615 කින් වැඩිවීම හා ස්ථාවර වත්කම් නඩත්තු හා අළුත්වැඩියා වියදම රු. 3,200,003 කින් අඩු වීම ආනයනය කරන ලද බඩ ඉරිඟු ව්‍යාපෘතිය මඟින් රු.41,075,571 ක ආදායම් ලැබීම, ස්ථාවර හා ඉතුරුම් තැන්පතු සඳහා ලද පොළිය රු. 3,800,894 කින් වැඩිවීම හා අනෙකුත් ආදායම් රු. 1,908,097 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය සෝයා බෝංචි වගා කරන ගොවීන් ආරක්ෂා කිරීමේ අරමුණින් ගොවි සංවිධානවලින් කිලෝග්‍රෑමයක් රු. 97.57 කට සෝයා බෝංචි මිලදී ගැනීමට ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කළද එම මිලට වැඩියෙන් රු. 107.97 ක් වැය කර ගොවි සංවිධාන නොවන වෙනත් ආයතනයකින් 2016 සිට 2018 දක්වා සෝයා බෝංචි මිලදී ගැනීම සඳහා කිලෝ ග්‍රෑම් 01 කට රු. 10.40 බැගින් රු. 5,238,750 ක අමතර පිරිවැයක් දරා තිබුණි. | ත්‍රිපෝෂ සමාගම වෙත ඇණවුම් බාරදීමේ අවශ්‍යතාවය මත අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් මිලදී ගත් සෝයා බෝංචි වෙනුවට වෙනත් ආයතනයකින් ලබා ගත් අතර සෝයා බෝංචි කිලෝවක් සඳහා රු. 11.05 ක මුදලක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණද ආයතනය විසින් රු. 10.40 ක් පමණක් ඉහත සමාගමට වැඩියෙන් ගෙවා තිබුණි. | ගොවි සංවිධාන වෙතින් පමණක් අනුමත මිලට සෝයා බෝංචි මිලදී ගත යුතුය. |
| (ආ) | ත්‍රිපෝෂ සමාගම විසින් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම නිසා සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් 34,740 ක් ප්‍රතික්ෂේප කර තිබූ අතර එම ප්‍රතික්ෂේප වූ තොගයෙන් කිලෝ ග්‍රෑම් 5,500 ක් මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන මව්පෝෂ සඳහා භාවිතා කර තිබුණි. ත්‍රිපෝෂ සමාගමෙන් ප්‍රතික්ෂේප කළ තොග මව්පෝෂ නිෂ්පාදනයට යෙදවීම මගින් ඉහළ සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහිකිරීමේ අරමුණ කරා ලඟාවීමේ ඉලක්කය වන පෝෂණ ගුණයෙන් වැඩි අමුද්‍රව්‍ය ලබාදීම සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | ත්‍රිපෝෂ සමාගමෙන් ප්‍රතික්ෂේප වූ තොගය නැවත සකසා භාවිතයට ගත හැකි හොඳ තත්ත්වයේ තිබූ මෙට්‍රික් ටොන් 5.5 ක ප්‍රමාණය දූමකරණය කර මව්පෝෂ නිෂ්පාදනය සඳහා යොදා ගත් අතර එම තොගය මිනිස් පරිභෝජනයට සුදුසු තත්ත්වයේ පැවතින. ඉතිරි තොගය සත්ව ආහාර සඳහා විකුණන ලදී. | මණ්ඩලයේ නිෂ්පාදන සඳහා නියමිත පිරිවිතර සහිත අමුද්‍රව්‍ය යොදා ගත යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු රු. 201,850 ක වියදමක් දරා බඩඉරිඟු මිලදී ගැනීමේ අධීක්ෂණ කටයුතු සඳහා යොදවා තිබුණද නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවූ බඩ ඉරිඟු මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | මණ්ඩලය විසින් මේ සම්බනධව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තක්සේරු අගය රු. 200,000 ක් වූ රෝද 04 ට්‍රැක්ටරයක් සහ රු. 16,000 ක් වූ කොකු නගුලක් වර්ෂ 05 කට ආසන්න කාලයක සිට භාවිතයට නොගෙන කලංකුට්ටිය කර්මාන්තශාලාවේ ගාල් කර තිබුණි. | 1476 ට්‍රැක්ටර් රථය 2016 පමණ සිට ධාවනයෙන් ඉවත් කර ඇති බවත් එය මේ වන විට අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. තවද කොකු නගුල අපහරණය කිරීමට නියමිතව ඇත. | අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජල පොම්ප 04 ක්, විදුලි මෝටර් 08 ක් ප්ලාස්ටික් ජල ටැංකියක් (500L) සහ භාවිතා කළ හැකි සහල්පිටි ඇසුරුම් 1,976 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | මෙම භාණ්ඩ භාවිතයට ගත නොහැකි තත්ත්වයේ ඇති අතර ඒවා අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් එය ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරමි. | භාවිතා කළ නොහැකි නම් අපහරණ කිරීමට කටයුතු කළ යුතුය. |